# සංස්කෘතික පසුබිම

රෝහණ පුරවරය අනාදිමත් කාලයක සිට උසස් සංස්කෘතියක් හා ශිෂ්ඨාචාරයක් ගොඩනැගුනු ප්‍රදේශයක් වශයෙන් ලක් ඉතිහාසයේ ප්‍රසිද්ධියට පත්වී තිබිණි. රුහුණු සංස්කෘතියේ වැදගත් ලක්ෂණයක් වූයේ, එය ඊටම ආවේණික වූ පෞද්ගලිකත්වයක් ගොඩනගා ගෙන තිබීමයි.

ජන සමාජයක් තුල උසස් සංස්කෘතියක් හා සභ්‍යත්වයක් බිහිවනුයේ සමෘද්ධිමත් අර්ථ ක්‍රමයක් මත බව ඉතිහාසය තුලින් පැහැදිලිවේ. එකල ආර්ථික අතින් සමෘද්ධිමත් වූ මාතර පුරවරයේ සංස්කෘතික හා අධ්‍යාත්මික වර්ධනයක්ද ඇතිවූ බව පෙන්වා දෙන තොරතුරු බහුලව දක්නට ඇත. බුදුගුණ කලාත්මක ලෙස බිතුසිතුවම් කරන ලද වෙහෙර විහාර , සංඝාවාස , සෙල්ලිපි ආදිය මගින් ඉපැරණි සංස්කෘතියක් හා උසස් ශිෂ්ටාචාරයක් තිබූ බවට සාධක පවතී. වැලිගම අග්‍රබෝධි විහාරය, මාතර වේරගම්පිට විහාරය , හත්බෝදිවත්ත මීට නිදසුන් කිහිපයක් වේ.

මාතර දිස්ත්‍රික්කයේ 19 වන ශතවර්ෂය හා ඊට පසු සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සොයා බැලීමක් මෙමගින් කරනු ලැබේ. අප රට නිදහස ලැබීමට පෙර පෘතුගීසී යුගයේ සිටම අධ්‍යාපනය තුලින් මෙරට ජනතාව රෝමානු කතෝලික ආගමට හරවා ගනු ලැබීය. එම ආගම හා සිරිත් විරිත් වැළඳගත් ජනතාව තුලින් පැරණි හෙළ සංස්කෘතික සභ්‍යත්වය බිඳවැටී යන තත්වයක් දක්නට ලැබුනි. මෙම නව සංස්කෘතික රටාව එතෙක් පැවති පන්සල් ආශ්‍රයෙන් සකස් වූ සිංහල බෞද්ධ සංස්කෘතික රටාවට හාත්පසින්ම විරුද්ධ විය. සාර ධර්ම පිරිහීගිය අතර වටිනා ධර්ම ග්‍රන්ථ පන්සලේ පොත්ගුලට සීමාවිය. මෙම නව සංස්කෘතියට විරුද්ධව එවකට නැගීසිටි රුහුණු ජනතාව, හික්කඩුවේ සුමංගල හිමියන්ගේ මූලිකත්වයෙන් ගාල්ලේ මුද්‍රණාලයක්ද ආරම්භ කරන ලදී. එසේම දහම් පොතපත මුද්‍රණය හා බෙදාහැරීම, බෞද්ධාගමික පාසල් ඇතිකිරීම, ආදිය මගින් නැවත බෞද්ධ ආගම හා සංස්කෘතිය පුනර්ජීවනය කිරීමට දකුණු ජනතාව උරෙන්උර ගැටී ක්‍රියාකර ඇත. මෙම චරිත තුල අනගාරික ධර්මපාල තුමා මාතරින් බිහිවූ වීරෝදාර පුද්ගලයෙකි.

සංස්කෘතිය හා බැඳී පවතින තවත් වැදගත් අංශයක් වනුයේ සාහිත්‍යයයි. සාහිත්‍යය යුග වශයෙන් බලනකල මහනුවර යුගයෙන් පසු මාතර යැයි සාහිත්‍ය අවධියක් ගැන පොතපතේ සඳහන් වේ.එම යුගය නූතන යුගය නමින්ද හැඳින්වේ. සංස්කෘත භාෂාව , පාලි භාෂාව මෙන්ම සම්ප්‍රදායික සිංහල පද්‍යය සාහිත්‍ය ද මෙම යුගයේ දක්නට තිබී ඇත. එවකට සිටි කරතොට ධම්මාරාම නාහිමියන් මාතර වේරගම්පිට රජමහා විහාරයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ආරම්භකර තිබූ බවද සඳහන් වේ. මාතර යුගයේ සිංහල සාහිත්‍යයේ විශිෂ්ට නිර්මාණයක් වශයෙන් 1806 වර්ෂයේ තෝමස් දිසානායක මුහන්දිරම් ලියනලද ගංගාරෝහණ වර්ණනාව හැඳින්විය හැකිය. නිල්වලා නදියේ මාතර සිට ගොඩපිටිය දක්වා ගිය පූජා පෙරහරක් ගැන මෙහි ජීවමාන ලෙසින් විස්තර කර තිබේ. මේ අන්දමට මාතර සිංහල සාහිත්‍ය පිළිබඳ උද්යෝගිමත්ව කටයුතු කළ ගිහි පැවිදි පරපුරක් එවකට සිටි බව පෙනේ. එසේම සිංහල සාහිත්‍ය ඔප් නංවන ලද තවත් අංගයක් වශයෙන් ජන කවියද හැඳින්විය හැකිය.

ලක්දිව ප්‍රචලිත නාට්‍ය සම්ප්‍රදාය තුනෙන් එකක් වන පහතරට නැටුම් කලාව මාතර දිස්ත්‍රික්කයේ තවත් කැපී පෙනෙන සංස්කෘතික ලක්ෂණයකි. බෞද්ධ පූජනීය ස්ථානයන්හි ආගමික උත්සව සඳහා පුහුණුකල නාට්‍ය කණ්ඩායම් මෙම කලාව නූතනයටද රැක ගැනීමට උත්සාහ දරනු ලැබේ. මේ හැර ගැමි

නාටක ඉතිහාසයේ විශේෂ ස්ථානයක් ගන්නා බලි තොවිල්, යාග හෝම, ශාන්තිකර්ම පැවැත්වීමද දිස්ත්‍රික්කයේ ප්‍රචලිත සංස්කෘතික ලක්ෂණයක් වේ. ලෙඩරෝග සුවකර ගැනීම, ඇස්වහ කටවහ දෝෂ මග හරවා ගැනීම හා තම ගම් බිම් වල කෘෂිකාර්මික භෝගයන්ගේ සශ්‍රීකත්වය පතා මෙම යාග හෝම පවත්වන ලදී.

මේ සම්බන්ධව විග්‍රහකර බලන කල්හි පහත රට නැටුම් කලාවේ විශේෂ අංශයක් වශයෙන් යක්තොවිල් හැඳින්විය හැකිය. සන්නියකුම, මහසොහාන් සමයම, රටයකුම, සූනියම් ආදිය මීන් සමහරකි. වැලිගම, පරවාහැර, දීයගහ යන ගම්මානයන්හි දැනටද මෙම පරසිඳු බලි තොවිල් හා ශාන්තිකර්ම රැක ගැනීමට උත්සාහ දරන පිරිසක් දක්නට ලැබේ. බලිතොවිල් තවත් නාට්‍ය විශේෂයකි. මැටි වලින් අඹන ලද යක්ෂ බලි රූප මෙයට යොදා ගෙන ශාන්තිකර්ම සිදුකරන ලද අතර ගම්මඩු, දෙවොල් මඩු ආදිය මඟින් දෙවියන්ට ස්තෝත්‍ර පූජා පවත්වන ලදී.

මාතර දිස්ත්‍රික්කය ලොව පතල වීමට තුඩුදුන් සංස්කෘතික ලක්ෂණයක් වශයෙන් කෝළම් මඩු හෙවත් කෝළම් නැටීම හැඳින්විය හැකිය. වැලිගම, මිරිස්ස පැරණිතම කෝළම් නාට්‍යය සම්ප්‍රදාය පැවති ප්‍රදේශයන් වේ. දැනටද මෙම ප්‍රදේශ වල එම ගම් වලට ආවේණික වූ පුද සිරිත් හා රංග ක්‍රම සහිතව කෝළම් නැටීම පවත්වාගෙන යනු ලැබේ. එම කෝළම් සම්ප්‍රදායන් දේශීය සංස්කෘතික උරුමයන් වශයෙන් හැඳින්විය හැකිය.

මේ හැර මාතර දිස්ත්‍රික්කයේ සංස්කෘතික ලක්ෂණ හුවා දක්වන කැටයම්, බිතු සිතුවම් හා චිත්‍ර කලාව, මූර්ති කලාව පිළිබිඹු කරන පැරණි විහාරස්ථාන දැනුදු දක්නට ලැබේ. වෙහෙරහේන, වැව්රුකන්නල ආදී සිද්ධස්ථාන නූතනයේද සංස්කෘතික අනන්‍යතාවය රැක ගන්නා වැදගත් ස්ථාන වශයෙන් හැඳින්විය හැකිය.

මාතර දිස්ත්‍රික්කයේ භාෂා ශෛලියේද පැහැදිලි වෙනස්කම් දක්නට ඇත. එහි බොහෝ විට දකුණට හෝ මාතරට සුවිශේෂී වූ පාරිභාෂිත වචන තිබේ. මක්කටද , ඔහේ , කොහේද ආදී වශයෙන් මාතර පුද්ගලයෙක් කථා කිරීමේදී බොහෝ විට ඔහු කුමන පළාතේද යන්න හඳුනා ගැනීමට හැකි අනන්‍යතාවයක් එම බස් වහරේ ඇත.

එසේම මාතර සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කිරීමට උරදුන් යුග පුරුෂයන් අතර වාදිහසිංහ බැදිගම ශ්‍රී රතනපාල, වැලිගම සුමංගල යන නාහිමිවරුන්ද, එම්. ධර්මරත්න පඬිතුමා, කුමාරතුංග මුනිදාස, වාසල මුදලි ඩබ්.ඒ.ජේ. ගුණවර්ධන යන වියතුන් අභිමානයෙන් සිහිපත් කල හැකිය.

බහුශ්‍රැතභාවයත්, ඥාන ශක්තිය හා පෞරුෂයත් උපයෝගී කරගෙන භාෂා ශාස්ත්‍රය හා සිංහල සාහිත්‍යයට අපරිමිත සේවයන් ඉටුකල තවත් නායකයන් බොහෝය. ප්‍රථම සිංහල නව කථාව ලෙස සැලකෙන මීනා කෘතියේ කතුවර මාතර විසූ අලුත්ගමගේ සයිමන් සිල්වා , ප්‍රසිද්ධ උපහාස කථා රචක ටී. ජී. ඩබ්. ද සිල්වා, සංගීතඥ රූපසිංහ මාස්ටර් වැනි කලාකරුවන්ද හෙළ හවුලේ නායකයකු හා ප්‍රසිද්ධ ගත් කතුවරයකුවන අමරසිරි ගුණවර්ධනයන්ද, සමස්ථ ලංකා කවි සම්මේලනයේ නායකයෙකු වූ හක්මණ බැන්ටිස් රණවීර යන මහත්වරුන් ද මේ අතරින් කැපී පෙනේ.

මෑත ඉතිහාසය තුළ තවත් සංස්කෘතික උරුමයක් දායාද කර දෙමින් , එතෙක් නුවරට සීමාවී තිබූ සියම් නිකායික භික්ෂූන් වහන්සේලාගේ උපසම්පදා විනය කර්ම කිරීමේ අයිතිය රෝහණ සංඝ සභාවට පැවරිණි. එහි පුරෝගාමී කාර්ය භාරය ඉටුකරන ලද්දේ පුරාවිද්‍යා චක්‍රවර්තී කඹුරුපිටියේ වනරතන හිමියන් විසින්ය.

මාතර දිස්ත්‍රික්කයේ සංස්කෘතික උරුමයන් විදහාපාමින් වාර්ෂිකව කෙරෙන පෙරහර චිත්තාකර්ෂණීය වේ . ඒ අතර දෙවිනුවර දේවාලය, වැව්රුකන්නල, වෙහෙරහේන විහාරස්ථාන හා ගැටබරුව විහරස්ථාන ප්‍රමුඛ ස්ථානයක් ගනී. දෙවිනුවර විෂ්ණු දෙවියන් උදෙසා දින 15 ක් පමණ පැවැත්වෙන සංස්කෘතික උත්සවයට දිවයිනේ නන් දෙසින් ජනී ජනයා ඇදී එති. වෙහෙරහේන හා වැව්රුකන්නල විශාල බුදු පිළිම වහන්සේලා මාතර බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාවය ඔප් නංවයි.

මාතර දිස්ත්‍රික්කයේ සංස්කෘතික වශයෙන් වැදගත්වන ආගමික ස්ථාන 12.3 වගුව මගින් පෙන්වා දී ඇත. ඒ අනුව දිස්ත්‍රික්කය පුරා බෞද්ධාගමික සිද්ධස්ථාන 646 ක් ද, මුස්ලිම් දේවස්ථාන 38 ක් ද, රෝමානු කතෝලික දේවස්ථාන 04 ක් ද, ක්‍රිස්තියානි දේවස්ථාන 14 ක් ද, හින්දු කෝවිල් 30 ක් ද, වෙනත් සිද්ධස්ථාන 8 ක් ද පිහිටා ඇති බව පෙනී යයි.

දිස්ත්‍රික්කයේ සංස්කෘතික කටයුතු නගා සිටුවීමට මෑතකදී මාතර පුරවරයේ පිහිටුවන ලද සංස්කෘතික මධ්‍යස්ථාන මහත් මෙහෙවරක් ඉටුකරනු ලැබේ. මේ හැර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද, සංස්කෘතික මධ්‍යස්ථාන ආරම්භකර ඇත. දිස්ත්‍රික්කයේ කලායතන, තරුණ තරුණියන්ගේ නර්තන හැකියාවන් ඔප්නැංවීමට මහත් සේවාවක් ඉටුකරනු ලබයි. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම කලායතන පිහිටුවා ඇත. කෙසේ වෙතත් දිස්ත්‍රික්කයේ පැරණි රංගන ශිල්පය හා සංගීත වාදනය රැකගැනීම මෙම කලායතනයන්හි පරමාර්ථය වේ.

# Cultural Background

City of Ruhuna is popular in the history of Sri Lanka as an area which is rich with advanced culture and civilization. The major and specific feature of the culture of Ruhuna is its own personality.

It is apparent through history that advanced culture an civilization are created within a society on a prosperous economy. We have more information which proves the cultural and spiritual development of them Matara city. There are evidences to prove with the help of temples and shrine rooms, scriptures etc. the fact that we had an ancient culture. Agrabodhi Vihara of Weligama, Weragampita Vihara of Matara and Hathbodhiwatta are examples for this.

Cultural features of Matara District in the $19^{th}$ Century and thereafter is inquired by this. Even before the independence of our country, from the Portuguese period people of this country were recruited to Roman Catholic religion through education. It could be observed the fact that Sinhala culture had being washed away from them. This new cultural system was totally against the Sinhala Buddhist culture formed closed to temple. Ethics were not followed and they were limited to books of the temple library. People of Ruhuna who came forward against this new culture opened a press also with the leadership of Ven. Hikkaduwe Sumangala Thero. People lived in the South much contributed to uplift Buddhism and restore our culture through distribution of Dhamma books and opening Buddhist Colleges. Among these characters Sir. Anagarika Dharmapala is a brave person born in Matara.

Literature is another important thing related with the culture. According to literary era or period we find Matara era after Kandy era. This Matara era is also known as present era. Language of Sanskrit, Pali and traditional Sinhala verses could be seen in this era. Ven, Karathota Dhammarama Thero had opened an institute at Weragampita Rajamaha Viharaya. Gangarohana Warnanawa which written by Thomas Dissanayaka Muhandiram in 1806 can be introduces as a great creation in Sinhala literature in Matara Era. In this book a procession (Perahera) started from Matara to Godapitiya is nicely described. Accordingly it is very clear the fact that in Matara era there was a team or generation who was very interested in Sinhala literature. On the other hand folk poem can also be introduced as another item which graced Sinhala literature.

Low Country Dancing is another distinguished cultural item of Matara District. Drama teams trained for religious festivals at Buddhist Places of sacred struggle to protect this art to the present.

When analyzed this, Devil Dancing can be noted as specific item of Low Country Dancing. Sanniyakuma, Mahason Samayama, Ratayakuma Suniyam are some of them. Even today there are some people in the villages of Weligama, Parawahera, Diyagaha who struggle to protect this art of devil dancing.

Kolam Madu alias play of Kolam can be noted as a cultural item which was helpful for Sri Lanka to be popular worldwide. Weligama and Mirissa are the areas where this art of Kolam Drama existed. Even today this art is practiced in these villages. This can be introduced as a local cultural heritage.

In addition ancient temples with carvings, frescoes, arts etc. are seen even today. Wewrukannala and Weherahena can be noted as important places which protect cultural identity.

Even in the style of language in Matara certain changes can be seen. They are mostly specific words limited to South or Matara. Language style of the people in Matara has its own language identity through which listeners can understand that they are Matara people.

On the other hand intellectuals like Rev. Wadihasinghe Badigama Sri Rathanapala, Weligama Sumangala Thero and Pandith M. Dharmarathna, Kumarathunga Munidasa, Wasalamudali W.M.J. Gunawardena who provided leadership to protect the cultural identity of Matara can be remembered with pride.

We have some of other leaders who rendered a greater service to language and Sinhala literature. Artists like Aluthgamage Simon Silva – Author of the first Sinhala novel- Mena, T.G.W. De Silva – famous story writer, Musician Rupasinghe Master and Mr. Amarasiri Gunawardena – famous book writer and Mr. Bantis Ranaweera of Hakmana are some of them.

Conducting Upasampada rituals of Siyam Mahanikaya in Matara is also an important event and Ven. Kamburupitiye Wanarathana Mahanayaka Thero provided leadership for that.

Annual precessions (Pereheras) which display cultural heritages of Matara District are attractive. Among them Devinuwara Esala festival, Weherehena and Getabaru temples are leading places. People from various parts of the Island come for Devinuwara Esala festival which lasts for 15 days. Huge statues of Lord Buddha of Weherehena and Wewrukannala grace the identity of Buddhist culture.

Culturally important religious places of Matara District are shown in table 12.3. Accordingly 646 Buddhist temples, 38 Muslim mosques, 14 church, 04 Roman Catholic Church, 30 Hindu Kovils and 08 others are in Matara District.

Recently established cultural centers in Matara play a major role in upgrading cultural affairs of the district. In addition, cultural centers have been set up in the Divisional Secretary's Divisions of Kirinda Puhulwella and Dickwella. Art centers in the district fulfill a greater task in improving dancing abilities of youths. Art centers have been set up in every Dvisional Secretary's Division. It is the objective of these art centers to protect old dancing and music in the district.